සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024**
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
**Support Test Paper for G.C.E (A/L)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: **භූගෝල විද්‍යාව (22)** | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 3 |

**උපදෙස්**

❖ මෙම ප්‍රශ්න පත්‍රය I, II සහ III ලෙස කොටස් තුනකින් සමන්විත වේ. I කොටස බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වන අතර ඒවාට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතුයි.

❖ I කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමි වේ.

❖ II කොටසේ ප්‍රශ්න දෙකට ම පිළිතුරු සැපයිය යුතුයි.

❖ III කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

❖ I, II සහ III කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතුයි.

## I කොටස

1. රටක ජන සංඛ්‍යාවේ ඝනත්ව වටිනාකම් වැනි ක්ෂේත්‍රීය ව්‍යාප්තියක් ඇති විචල්‍යයන් නිරූපණය කිරීම සඳහා බහුලවම යොදාගන්නා සිතියම් වර්ගය කුමක් ද?

   (1) සමසංඛ්‍යා රේඛා සිතියම් (2) 1 : 50,000 මෙට්‍රික් සිතියම් (3) භූ ලක්ෂණ සිතියම්
   (4) තේමා සිතියම් (5) තිත් සිතියම්

   (.....................)

2. 1 : 25,000 ට ඇඳ ඇති භූ ලක්ෂණ සිතියමක 4 km ක් වූ මාර්ගයක් සිතියමක නිරූපණය වන්නේ කොපමණ දිගකින් ද?

   (1) 16 cm (2) 1 cm (3) 8 cm (4) 5 cm (5) 8 km

   (.....................)

3. පහත සඳහන් භූ ලක්ෂණ අනුපිළිවෙළින් දැක්වෙන්නේ,



   (1) නෙරුව, දළ බෑවුම, රැළි බිම, කපොල්ල (2) නිම්නය, දළ බෑවුම, තැනිතලාව, කපොල්ල
   (3) නිම්නය, දළ බෑවුම, රැළි බිම, කපොල්ල (4) නෙරුව, මොහොර, තැනිතලාව, කපොල්ල
   (5) නෙරුව, දළ බෑවුම, තැන් උස, කපොල්ල

   (.....................)

4. ශ්‍රී ලංකාවේ 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන භෞතික ලක්ෂණයක් හා සංස්කෘතික ලක්ෂණයක් අනුපිළිවෙළින් දැක්වෙන්නේ,

(1) ගල සහ වනාන්තර (2) පන්සල සහ ලඳු කැලෑ (3) ජනාවාස සහ වී වගාව

(4) ගංගාව සහ වාරිමාර්ග ඇළ (5) වැලිපරය සහ පාෂාණ උද්ගතය

(....................)

5. ශ්‍රී ලංකාවේ 1 : 50,000 භූ ලක්ෂණ සිතියම් පත්‍රයක නිවැරදි දිග සහ පළල වන්නේ,

(1) කි.මී. 100 x 80 (2) කි.මී. 40 x 25 (3) කි.මී. 40 x 80

(4) කි.මී. 25 x 40 (5) කි.මී. 80 x 50

(....................)

6. භූගෝලීය තොරතුරු පද්ධතියක ආදාන උපාංගයක් නොවන්නේ,

(1) චුම්බක තැටි (2) සුපරීක්ෂණ (3) අංකන ඵලකය

(4) තිර සංඛ්‍යාංකනය (5) සන්දර්ශකය

(....................)

7. අවකාශීය නොවන දත්ත මිනුම් වර්ග හතරක් යටතේ දැක්විය හැකි ය. එම මිනුම් නිවැරදි ව දැක්වෙන්නේ,

(1) නාමමාත්‍ර, ක්‍රමික, සිව්රුැක්, අනුපාත (2) නාමමාත්‍ර, ක්‍රමාන්කිත, ප්‍රාන්තර, අනුපාත

(3) ප්‍රාන්තර, නාමමාත්‍ර, සිව්රුැක්, අනුපාත (4) නාමමාත්‍ර, නාමමාත්‍ර, සිව්රුැක්, අනුපාත

(5) ප්‍රාන්තර, දෛශික, නාමමාත්‍ර, අනුපාත

(....................)

8. භූගෝලීය තොරතුරු පද්ධතියක අවකාශීය දත්ත සඳහා උදාහරණයක් වන්නේ,

(1) පාසලේ ගොඩනැගිලි සංඛ්‍යාව (2) පංති අනුව ශිෂ්‍ය සංඛ්‍යාව

(3) පාසල්වල පිහිටීම (4) ගුරුවරුන්ගේ අධ්‍යාපන මට්ටම්

(5) ශිෂ්‍ය සංඛ්‍යාව

(....................)

9. 21, 35, 52, 68, 73, 85, 91 දක්වා ඇති සමූහයේ ඉහළ ම චතුර්ථකය අයත් පිළිතුර වන්නේ,

(1) 55 (2) 91 (3) 52 (4) 75 (5) 85

(....................)

10. ගෝලීය ජල ව්‍යාප්තිය අනුව පෘථිවියෙහි අන්තර්ගත භූගත ජල පරිමාව කොපමණ ද?

(1) 1% (2) 20% (3) 3% (4) 79% (5) 52%

(....................)

11. විපරිත පාෂාණයකට උදාහරණයක් වන්නේ,

(1) නයිස් (2) වැලිගල් (3) ශල්ක (4) හුණුගල් (5) ග්‍රැනයිට්

(....................)

12. විකිරණශීලී බලශක්ති ගණයට අයත් ඛනිජ වර්ග දෙකක් වන්නේ,

(1) යපස් හා ක්‍රෝමියම් (2) මොනසයිට් හා තෝරියනයිට් (3) නිකල් සහ තෝරියනයිට්

(4) ලිමෝනයිට් සහ මොනසයිට් (5) මොනසයිට් සහ නිකල්

(....................)

13. පහත සඳහන් භූරූප නිර්මාණ ක්‍රියාවලි අතරින් අන්තර්ජනය බලවේගයක් නොවන්නේ,

(1) භූමිකම්පා (2) භූගත ජලය (3) ආතතීය චලන

(4) සම්පීඩන චලන (5) යමහල් ක්‍රියාවලීන්

(....................)

14. සුවිශේද ලක්ෂණයකට උදාහරණයක් ලෙස දැක්විය හැක්කේ,

(1) රතු මුහුද (2) මධ්‍ය අත්ලාන්තික් සාගරික වැටි

(3) හිමාලය කඳු (4) ඉන්දියන් අර්ධද්වීපය (5) සීනායි අර්ධද්වීපය

(....................)

15. කෙපන්ගේ දේශගුණික වර්ගීකරණයේ වියළි දේශගුණයන් උප බෙදීම්වල සංකේත මොනවා ද?

(1) CF,CW,CS (2) ET,EF (3) AF,AM,AW (4) BS,BW (5) DF,DW

(....................)

16. පිටාර තැන්නක ලක්ෂණයක් වන්නේ,

(1) ඩ්‍රම්ලිනය (2) ගල්වනය (3) පටු නිම්නය (4) දියඇලි (5) දූනුවිල්

(....................)

17. 12 ශ්‍රේණියේ සිසුන්ගේ උස හා බර දැක්වෙනුයේ කුමන දත්ත වර්ගයකට ද?

(1) සන්තානික දත්ත (2) සාමූහික දත්ත (3) විවික්ත දත්ත

(4) ප්‍රමාණාත්මක දත්ත (5) අවකාශීය දත්ත

(....................)

18. සියල් සහ සීමා ස්ථර දෙක වෙන් කරන සීමාව වන්නේ,

(1) අධෝගෝලය (2) මොහොරෝවිසික් අසන්තතිය

(3) ලේමන් අසන්තතිය (4) ගුටෙන්බර්ග් අසන්තතිය (5) කොන්රඩ් අසන්තතිය

(....................)

19. සුළං මගින් නිර්මාණය කරන බාදිත භූ රූපයක් නොවන්නේ,

(1) යාබැම (2) බියුට් (3) සොයිගම් (4) ඉන්සල්බර්ග් (5) බාර්කන්

(....................)

20. තෘතීක සුළං සංසරණයට අයත් සුළං වර්ග දෙකක් වන්නේ,

(1) වෙළඳ සුළං හා ධ්‍රැව සුළං (2) සුළං බටහිර සුළං හා ධ්‍රැව සුළං (3) වාසුළි සුළං හා මෝසම් සුළං

(4) බටහිර සුළං හා වෙළඳ සුළං (5) මෝසම් සුළං හා නිම්න සුළං

(....................)

21. කාලගුණ තොරතුරු එක්රැස් කිරීමේ දී අහසේ වළාකුළු වැස්ම පිළිබඳ ප්‍රකාශ කරන මිනුම වන්නේ,

(1) ෆැරන්හයිට් (2) සෙන්ටිමීටර් (3) බෝෆට් (4) ඔක්ටාස් (5) රිට්ටර්

(....................)

22. හිම ස්ථර මගින් පරාවර්තනය කරනු ලබන සූර්ය විකිරණ ප්‍රතිශතය

(1) 96% (2) 35% (3) 75% (4) 90% (5) 10%

(....................)

23. පෘථිවිය මත බහුලතම සංරචකය කුමක් ද?

(1) ජලය (2) හිම (3) ශාක (4) නයිට්‍රජන් (5) වැලි පස

(....................)

24. කැරිබියන් මුහුදු කලාපයේ දී නිවර්තන වාසුළි හඳුන්වනු ලබන්නේ,

(1) වාසුළි (2) හරිකේන් (3) බැගියෝ (4) විලි විලිස් (5) ටයිෆූන්

(....................)

25. සූර්ය ලප ඇති වීමට හේතුව වන්නේ,

(1) ග්‍රහක සමඟ ගැටීම (2) සූර්ය විකිරණ වැඩි වීම

(3) සූර්යයා මිය යන ක්‍රියාවලිය ආරම්භ වීම (4) සූර්යයාගේ චුම්බක ක්ෂේත්‍රයේ පිපිරීම් ය.

(5) සෞරග්‍රහ මණ්ඩලයේ බලපෑම

(....................)

26. ජාතිය, ආගම, වාර්ගිකත්වය දේශපාලනය හෝ පාරිසරික ආපදා හේතු නිසා රටක් හැරයන පුද්ගලයෙකු හැඳින්වෙන නාමය වන්නේ

(1) විගමනිකයා (2) ආගමනිකයා (3) සරණාගතයා

(4) සංක්‍රමණිකයා (5) සංගමනිකයා

(....................)

27. සංක්‍රමණයට බලපාන ඇදගැනීමේ සාධකකට උදාහරණයක් වන්න්,

(1) ග්‍රාමීය ප්‍රදේශවල ඉඩම් හිඟය (2) රටක ග්‍රාමීය ප්‍රදේශවල පවතින දරිද්‍රතාව

(3) යුද්ධ තත්ත්ව නිසා රට හැර යාම (4) ආසන්න නගරයක රැකියා අවස්ථා ඇතිවීම

(5) ප්‍රධාන නගරවල අධික ජනගහනය

(....................)

28. යුරෝපීය රටවල නාගරීකරණය ආරම්භ වීමට මුල් වූ පළමුවන පූර්ව අවශ්‍යතාව කුමක් ද?

(1) යටත්විජිත පිහිටුවීම (2) ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්

(3) රටේ භූමියේ අයිතිය පෞද්ගලීකරණය (4) පළාත් පාලන යාන්ත්‍රණයක් පිහිටුවීම

(5) ග්‍රාමීය අංශයේ කෘෂිකර්මාන්තයේ අතිරික්තයක් නිපදවීම.

(....................)

29. රටක ජන සංඛ්‍යාවේ වර්ධනය තීරණය වන සාධකය වන්නේ,

(1) උපත්, මරණ හා ආයු අපේක්ෂාව (2) උපත්, මරණ හා සංක්‍රමණය

(3) උපත්, ස්වාභාවික වර්ධනය හා විගමනය (4) උපත්, මරණ හා ආගමනය

(5) උපත්, මරණ හා විගමනය

(....................)

30. අග්නිදිග ආසියාවේ වඩාත්ම ජනාධික රට කුමක් ද?

(1) සිංගප්පූරුව (2) වියට්නාමය (3) ඉන්දුනීසියාව (4) ලාඕසය (5) කාම්බෝජය

(....................)

31. ලෝක ජන සංඛ්‍යාව මිලියන 07 බවට පත් වූ වර්ෂය කුමක් ද?

(1) 2010 (2) 2011 (3) 2012 (4) 2013 (5) 2019

(....................)

32. උපත් අනුපාතය අඩු වීම හා වියපත් ජනතාව වැඩි වීම නිසා නිර්මාණය වන ජන සංඛ්‍යා හායන පිරමීඩයක් දක්නට ලැබෙන ආසියාතික රට වන්නේ,

(1) ජපානය (2) සිංගප්පූරුව (3) තායිලන්තය (4) වියට්නාමය (5) මාලදිවයින

(....................)

33. ලෝකයේ නිෂ්පාදනය කරනු ලබන යපස්වලින් 95%ක් ම යොදාගනු ලබන්නේ,

(1) මෝටර් රථ කර්මාන්තයට (2) යකඩ හා වානේ නිෂ්පාදනයන්ට (3) නැව් කර්මාන්තයන්ට

(4) පරිගණක නිෂ්පාදනයට (5) අධිතාක්ෂණ කර්මාන්තයට

(....................)

34. ලෝකයේ පෙට්‍රෝලියම් නිෂ්පාදනයේ ප්‍රමුඛයන් හා ඒවා ආනයනය කරන ප්‍රධාන රටවල් දෙක ඇතුළත් පිළිතුර වන්නේ,

(1) ඇමරිකා එක්සත් ජනපදය හා ජපානය (2) ඕස්ට්‍රේලියාව හා චීනය

(3) චීනය හා ඉන්දියාව (4) කුවේටය හා චීනය (5) චීනය හා ජපානය

(....................)

35. ජාන තාක්ෂණය භාවිත කර ඇති භෝගයක් වන්නේ,

(1) IRB - වී (2) BT - බඩ ඉරිඟු (3) H4 - වී

(4) IR64 - වී (5) NER - තිරිඟු

(.....................)

36. ජෛවීය කෘෂිකර්මාන්තයෙන් දියුණුවට හේතුව නිවැරදිව දැක්වෙන ප්‍රකාශය වන්නේ,

(1) හරිත විප්ලවයට විරුද්ධ වූවක් ලෙස (2) කොමියුනිස්ට් වාදයට විරුද්ධව

(3) ධනවාදයට විරුද්ධව (4) ලිබරල්වාදයට විරුද්ධව

(5) සමාජවාදයට විරුද්ධව

(.....................)

37. එල් නිනෝ සංසිද්ධිය නිර්මාණය වන්නේ කවර ප්‍රදේශය ඇසුරෙන් ද?

(1) නැගෙනහිර අත්ලාන්තික් සාගරය (2) බටහිර උතුරු ඇමරිකා වෙරළ

(3) දකුණු ඇමරිකා බටහිර වෙරළ (4) නැගෙනහිර උතුරු ඇමරිකා වෙරළ

(5) බටහිර ශාන්තිකර සාගරය

(.....................)

38. මිහිකත සමුළුව පවත්වනු ලැබූ නගරය පිහිටියේ,

(1) ඉන්දියාවේය. (2) රුසියාවේය. (3) ආජන්ටිනාවේය. (4) බ්‍රසීලයේය. (5) ජර්මනියේය.

(.....................)

39. ආසියන් සමාගමට අයත් නොවන රට නිවැරදිව දක්වා ඇත්තේ,

(1) ඉන්දුනීසියාව (2) මැලේසියාව (3) ඉන්දියාව (4) පිලිපීනය (5) සිංගප්පූරුව

(.....................)

40. ලෝකයේ බහුජාතික සමාගම්වල ප්‍රතිපත්තිය නිවැරදි ව දැක්වෙන්නේ,

(1) හැකිතාක් ශාඛා රටවල් පුරා ව්‍යාප්ත කිරීම

(2) වැඩි සංඛ්‍යාවකට රැකියා සැපයීම

(3) මව් රටට උපරිම වාසි ගෙන දෙන සේ ප්‍රාග්ධනය ආයෝජනය කිරීම

(4) මව් රටෙන් කෙරෙන නිෂ්පාදන විදේශවල අලෙවි කිරීම

(5) මව් රටේ කීර්තිනාමය ලොව පුරා ප්‍රචලිත කිරීම

(.....................)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024**
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
**Support Test Paper for G.C.E (A/L)**

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | **භූගෝල විද්‍යාව (22)** |
|---|---|---|---|

**උපදෙස්**

- II කොටසේ ප්‍රශ්න දෙකට ම පිළිතුරු සැපයිය යුතුයි.
- III කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.
- මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක කොටසක්, ලෝක ආකෘති සිතියමක්, ප්‍රස්තාර කඩදාසියක්, ඩ්‍රෝවින් කඩදාසි දෙකක් සපයනු ලැබේ.

## II කොටස

(1) ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලද 1 : 50,000 පරිමාණයේ හපුතලේ භූ ලක්ෂණ සිතියමෙහි කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ඡ රේඛා අන්තරය මීටර් 20 ලෙස දක්වා ඇත. එම සිතියම පාදක කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සැලකිය යුතුයි :**

- ප්‍රශ්නයට අදාළ අංකය සහ අදාළ උප අංක, පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
- පිළිතුරු භූ ලක්ෂණ සිතියමේ ලිවිය යුතු නොවේ.
- සපයා ඇති භූ ලක්ෂණ සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු නොවේ.

(i) සිතියමේ A-B රේඛාවෙන් දැක්වෙන භූ බෑවුම් විෂමතා ලක්ෂණය නම් කරන්න. **(ල. 01)**

(ii) සිතියම් ප්‍රදේශයේ C වලින් දැක්වෙන ලක්ෂණය නම් කරන්න. **(ල. 01)**

(iii) සිතියම් ප්‍රදේශයේ D මගින් දක්වා ඇති ජලවහන ලක්ෂණය නම් කරන්න. **(ල. 01)**

(iv) සිතියම් ප්‍රදේශය තුළ දක්නට ලැබෙන ජලවහන රටාවන් කෙරෙහි භූ විෂමතාවයේ බලපෑම කෙටියෙන් විස්තර කරන්න. **(ල. 03)**

(v) E චතුරස්‍රය තුළ දක්නට ලැබෙන පොදු සේවා සපයන ආයතන 4 ක් නම් කරන්න. **(ල. 02)**

(vi) F චතුරස්‍රය 1 : 25,000 පරිමාණය ඇඳ එහි රේඛීය පරිමාණය ඇඳ දක්වන්න. **(ල. 04)**

(vii) සිතියම් ප්‍රදේශයේ මාර්ග ජාලය හා ජනාවාස ව්‍යාප්තිය කෙරෙහි භූ විෂමතාවයේ බලපෑම කෙටියෙන් විස්තර කරන්න. **(ල. 04)**

(viii) සිතියම් ප්‍රදේශයේ කෘෂිකාර්මික භූමි පරිභෝගය හා භූ විෂමතා අතර පවතින සම්බන්ධතාව කෙටියෙන් විස්තර කරන්න. **(ල. 04)**

(2) සම්මත සංකේත හා වර්ණ යොදා ගනිමින් පහත සඳහන් දෑ සපයා ඇති ලෝක සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

- කොංගෝ ගඟ
- හෙක්ලා ගිනිකන්ද පිහිටි රට
- කැනරි ප්‍රවාහය
- බයිකල් විල
- සමකය
- ලොව ගැඹුරුම සාගරික ආගාධය
- ඇල්ප්ස් කඳුවැටිය
- භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථාන පිහිටා ඇති රට
- පෙට්‍රෝලියම් හා සම්බන්ධ රෝයල් ඩච් ෂෙල් සමාගම පිහිටි රට
- අග්නිදිග ආසියානු සංගමය ආරම්භය සිදු වූ නගරය (ල. 10)

**III කොටස**

(3) (i) නවීන සිතියම් විද්‍යාව යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල. 02)

(ii) දුරස්ථ සංවේදය යන්න නිර්වචනය කරන්න. (ල. 03)

(iii) දුරස්ථ සංවේද කටයුතුවල දී දත්ත රැස් කිරීම සඳහා භාවිත කරන ක්‍රම දෙකක් නම් කර එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

(iv) දුරස්ථ සංවේද ක්‍රම ශිල්පීය මගින් ලැබෙන තොරතුරුවල නිරවද්‍යතාව කෙරෙහි බලපාන සාධක තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

(4) (i) සන්තතික දත්ත සහ විවික්ත දත්ත කෙටියෙන් හඳුන්වන්න. (ල. 02)

(ii) දත්ත රැස් කිරීමේ ප්‍රධාන ක්‍රම දෙක කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

(iii) සමීක්ෂණයක් සිදු කිරීමේ දී භාවිත වන ක්‍රම දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

(iv) "තොරතුරු සංශ්ලේෂණය හා තීරණවලට එළඹීම සඳහා ප්‍රායෝගික භූගෝල විද්‍යා ක්‍රම භාවිතය වැදගත්ය." කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල. 06)

(5) 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ උපත් සංඛ්‍යාව දැක්වෙන තොරතුරු පහත දැක්වේ. එම තොරතුරු පදනම් කර ගනිමින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

**වගු අංක 1**

**ශ්‍රී ලංකාවේ උපත් සංඛ්‍යාව 2008 - 2014**

| වර්ෂය | උපත් සංඛ්‍යාව |
|---|---|
| 2008 | 379 912 |
| 2009 | 376 843 |
| 2010 | 363 881 |
| 2011 | 363 415 |
| 2012 | 355 900 |
| 2013 | 365 792 |
| 2014 | 349 715 |

**මූලාශ්‍රය : රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව**

(i) වගු අංක 01 තොරතුරු භාවිතයෙන් මධ්‍යන්‍යය ගණනය කරන්න. (ල. 04)

(ii) මධ්‍යන්‍ය අපගමන ප්‍රස්තාරය නිර්මාණය කරන්න. (ල. 08)

(iii) ශ්‍රී ලංකාවේ 2008 - 2014 කාලය තුළ උපත් අනුපාතිකය මධ්‍යන්‍යයේ සිට සිදු වී ඇති වෙනස්කම් කෙටියෙන් දක්වන්න. (ල. 03)

(6) අංක 02 වගුව ඇසුරෙන් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

**වගු අංක 2**

**ශ්‍රී ලංකාවේ නගර කිහිපයක ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජන සංඛ්‍යාව 2011**

| නගරය | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|
| කොළඹ | 346 366 | 300 734 |
| දෙහිවල ගල්කිස්ස | 105 522 | 105 024 |
| මොරටුව | 87 313 | 90 250 |
| ශ්‍රී ජයවර්ධනපුර | 59 993 | 56 373 |
| ගම්පහ | 28 483 | 28 978 |
| මීගමුව | 60 947 | 60 754 |
| කළුතර | 18 912 | 18 539 |
| මහනුවර | 54 288 | 55 055 |
| මාතලේ | 17 425 | 18 678 |
| නුවරඑළිය | 12 959 | 12 429 |

**මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2011**


(i) වගුවෙහි දත්ත යොදාගනිමින් ද්විත්ව තීරු ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න. (ල. 08)

(ii) ඔබ නිර්මාණය කළ ප්‍රස්තාරය ඇසුරෙන් වගුවෙහි සඳහන් නගරවල ජන සංඛ්‍යා ව්‍යූහය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

(iii) ඉහත (i) හි සඳහන් ද්විත්ව තීරු ප්‍රස්තාර ක්‍රමයේ වාසි තුනක් සඳහන් කරන්න. (ල. 03)

ද/රජළ සුජාතා විදුහල - 13 ශ්‍රේණිය

# SRI LANKA 1: 50, 000 A PART OF HAPUTALE SHEET 76




Compiled from Satellite images
Published by the Survey Department of Sri Lanka
State Rights Reserved

Second Edition 2019
Printed in 2022



උ/පෙළ - භූගෝල විද්‍යාව - 13 ශ්‍රේණිය

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024**
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
**Support Test Paper for G.C.E (A/L)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: **13** | විෂයය / பாடம் / Subject: **භූගෝල විද්‍යාව (22)** | පත්‍රය / வினாத்தாள் / Paper: **II** | පැය / மணித்தியாலம் / Hours: **3** |


**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**

**උපදෙස්**

❖ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

(1)




(i) ඉහත දක්වා ඇති ලෝක සිතියමේ අංක (1) - (4) දක්වා ඇති භූ තැටි නම් කරන්න. **(ල. 02)**

(ii) භූ තැටි චලනය සිදුවන ආකාර තුන නම් කර කෙටියෙන් විස්තර කරන්න. **(ල. 06)**

(iii) තිරස් චලන නිසා නිර්මාණය වන භූ රූප තුනක් රූපසටහන් සහිතව විස්තර කරන්න. **(ල. 06)**

(iv) භූ තැටි චලන නිසා සිදුවන ආපදා දෙකක් කෙටියෙන් විස්තර කරන්න. **(ල. 06)**

(2) (i) දේශගුණ වෙනස්වීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? **(ල. 02)**

(ii) දේශගුණ වෙනස්වීම කෙරෙහි බලපාන භෞතික සාධක දෙකක් හා මානව සාධක දෙකක් කෙටියෙන් විස්තර කරන්න. **(ල. 06)**

(iii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා ඇති වූ අහිතකර ප්‍රතිවිපාක තුනක් කෙටියෙන් විස්තර කරන්න. **(ල. 06)**

(iv) ගෝලීය උෂ්ණත්වය පාලනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් විස්තර කරන්න. **(ල. 06)**

(3) (i) බියෝමයක් වනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? (ල. 02)


(ii) බියෝම වර්ග 6 ක් නම් කර ඉන් එකක් පහත ලක්ෂණ යටතේ විස්තර කරන්න. (ල. 06)

- ව්‍යාප්තිය
- දේශගුණය
- ශාකවල ස්වාභාවය

(iii) ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති අතර තෙත්බිම්වල වැදගත්කම කරුණු තුනක් යටතේ විස්තර කරන්න. (ල. 06)

(iv) ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණය සඳහා ගෙන ඇති නෛතික ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

(4)




-වෙරළ-

(i) ඉහත රූපසටහනේ A - D දක්වා නම් කරන්න. (ල. 02)

(ii) තරංග ආශ්‍රිතව ඛාදනය සිදුවන ආකාර නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

(iii) තරංග හේතුවෙන් වෙරළ ඛාදනය මගින් නිර්මාණය වන භූ රූප තුනක් රූප සටහන් සහිතව විස්තර කරන්න. (ල. 06)

(iv) තරංග නිධි සාධිත භූ රූප තුනක් නිර්මාණය වන ආකාරය රූපසටහන් සහිතව විස්තර කරන්න. (ල. 06)

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

(5) **වගු අංක 03**

**ලෝකයේ ප්‍රධාන කලාප අනුව නාගරීකරණය ව්‍යාප්තිය**

| කලාපය | නාගරික ජන සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 1950 | 2000 | 2015 | 2020 | 2050 |
| ලෝකය | 750 903 | 2 868 308 | 3 981 498 | 4 378 994 | 6 679 756 |
| සංවර්ධිත රටවල් | 446 284 | 883 880 | 979 089 | 1 003 640 | 1 123 972 |
| සංවර්ධනය වන රටවල් | 304 619 | 1 914 428 | 3 002 409 | 3 375 354 | 5 555 784 |
| අප්‍රිකාව | 32 659 | 285 998 | 991 531 | 587 738 | 1 488 920 |
| ආසියාව | 246 193 | 1 399 722 | 2 119 873 | 2 361 484 | 3 479 059 |
| යුරෝපය | 284 085 | 516 725 | 547 147 | 556 684 | 598 857 |
| ලතින් ඇමරිකාව සහ කැරිබියන් | 69 759 | 397 062 | 505 392 | 539 427 | 685 070 |
| උ. ඇමරිකාව | 110 300 | 247 471 | 290 616 | 304 761 | 386 690 |
| ඕෂනියාව | 7 906 | 21 329 | 26 938 | 28 919 | 41 160 |

**මූලාශ්‍රය - United Nations, Department of Economic and Social Affairs, Population Division (2018)**

(i) නාගරීකරණය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? **(ල. 02)**

(ii) ඉහත වගු අංක 03 යොදා ගනිමින්, ලෝකයේ 1950 - 2050 දක්වා කාලය තුළ කලාප අනුව නාගරීකරණයේ සිදු වී ඇති වෙනස්කම් 4 ක් නම් කරන්න. **(ල. 06)**

(iii) නාගරීකරණයේ ප්‍රවණතා තුනක් කෙටියෙන් විස්තර කරන්න. **(ල. 06)**

(iv) ශ්‍රී ලංකාවේ නාගරීකරණයේ ආශ්‍රිත ගැටලු තුනක් කෙටියෙන් විස්තර කරන්න. **(ල. 06)**

(6) (i) සංක්‍රමණ යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? **(ල. 02)**

(ii) සංක්‍රමණ කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක කෙටියෙන් විස්තර කරන්න. **(ල. 06)**

(iii) සංක්‍රමණ හේතුවෙන් ප්‍රභව රටවල් මුහුණදෙන ගැටලු තුනක් කෙටියෙන් විස්තර කරන්න. **(ල. 06)**

(iv) සංක්‍රමණ හේතුවෙන් ශ්‍රී ලංකාව මුහුණදෙන ගැටලු තුනක් විස්තර කරන්න. **(ල. 06)**

(7) (i) ආකර කැනීම සිදු කරන ක්‍රම දෙක කෙටියෙන් විස්තර කරන්න. **(ල. 06)**

(ii) ඛනිජ සම්පත් උපයෝජනයේ දී ඇතිවන පාරිසරික හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් විස්තර කරන්න. **(ල. 06)**

(iii) ලෝකයේ වර්තමානයේ කර්මාන්ත ස්ථානගත වීමේ මෑතකාලීන ප්‍රවණතා තුනක් කෙටියෙන් විස්තර කරන්න. **(ල. 06)**

(iv) සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවට සිදු කරන බලපෑම කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. **(ල. 06)**



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

(8) (i) ගෝලීයකරණය යනු කුමක් ද? (ල. 02)

(ii) ගෝලීයකරණයේ ගති ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

(iii) ගෝලීයකරණයේ ප්‍රධාන වාහක තුන නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

(iv) ගෝලීයකරණය සංවර්ධනය වෙමින් පවතින රටවලට කරන බලපෑම කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල. 06)

PAST PAPERS WIKI

(14) WWW.PastPapers.WiKi (14)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!



PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න